දොම්පෙ ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය
-----------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 16 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් 13 කට අදාලව රු.3,493,092 ක් ගිණුම්ගතකර නොතිබුණු අතර වත්කම් 04කට අදාළ රු.1,336,120 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම් ගත කළයුතු වේ. | 2019 වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) | තැන්පත් ලේඛනය අනුව රු.162,777 ක් වටිනා තැන්පතු ශේෂ 05 ක් ගිණුම්ගතකර නොතිබුණි. | තැන්පතු ශේෂ නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |
| (iii) | ව්‍යාපෘති 21 කට අදාළව ණයගැති ශේෂ රු.8,136,746 ක් හා ණයහිමි ශේෂ රු.8,136,746 ක් ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |

1.4 <u>අනුකූල නොවීම</u>

<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) 371 (2) | 2008 වර්ෂයේ සිට පැවත එන රු.82,656 ක අත්තිකාරම් ශේෂය පියවීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළයුතු වේ. | අත්තිකාරම් මුදල් සම්බන්ධයෙන් කිසිදු ලිපිගොනුවක් හෝ ලියවිල්ලක් සොයා ගැනීමට අපහසු බැවින්, එම මුදල කපාහැරීම සඳහා පළාත් පාලන කොමසාරිස් ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. |
| (ii) 571 | වටිනාකම රු.1,526,267 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළයුතු වේ. | වර්ෂ දෙකක කාලය ඉක්ම වූ රු.1,526,267 තැන්පතු මුදල් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලබන අතර ඉකුත් වූ තැන්පතු පිළිබදව අර්ධ වාර්ෂික ලැයිස්තු පිළියෙල කිරීමටද කටයුතු කරමි. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.26,395,978 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.42,615,686 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**2018 වර්ෂය** **2017 වර්ෂය**

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 14,191,940 | 19,427,587 | 16,317,043 | 3,110,544 | 7,362,314 | 9,335,959 | 8,134,508 | 1,201,451 |
| කුලී | 4,351,800 | 52,725,117 | 52,725,117 | - | 2,978,950 | 3,065,150 | 3,065,150 | - |
| බලපත්‍ර ගාස්තු | 22,554,540 | 20,501,387 | 20,185,266 | 316,121 | 14,664,110 | 9,735,033 | 9,673,682 | 61,351 |
| වෙනත් ආදායම් | - | - | - | - | - | - | - | - |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂ 10 ට වැඩි , වර්ෂ 5 – 10 අතර හා වර්ෂ 03 සිට 05 දක්වා පූගොඩ උප කාර්යාලයේ පිළිවෙලින් රු.54,874, රු.420,024, රු.83,220 ක් ද දොම්පෙ උප කාර්යාලයේ රු.7,100, රු.33,907ක් හා රු.73,556 ක් හිඟ වරිපනම් ශේෂ පැවතුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පූගොඩ උප කාර්යාලයේ සහ දොම්පෙ උප කාර්යාලයවල අවුරුදු 10 වැඩි රු.156,776 ක වරිපනම් හිඟ මුදලක් පවතින අතර, එම හිග මුදල් වලින් වැඩිපුර කොටසක් රජයේ ආයතන වලින් වන අතර, මේ වසර අවසානයේ ජංගම සේවා මගින් දේපල තහනමට ගෙන අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | රු. 3,110,544 ක් වූ හිඟ ශේෂය තුළ රු.10,000 වැඩි ශේෂ වැකේ උප කාර්යාලයේ ඒකක 09 ක් සහ පූගොඩ උප කාර්යාලයේ 05 ක් පැවතුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | රු.10000 වැඩි වරිපනම් බදු හිඟ වැකේ උප කාර්යාල ඒකක 11 කින් අය කරගෙන ඇති අතර, පූගොඩ උප කාර්යාලයේ පවතින ඒකක 13 කින් ඒකක 08 ක මුදල වන රු. 139,859 2019 මාර්තු 31 දිනය වන විට අය වී ඇත. |

### 2.2.3 වෙනත් ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා බල ප්‍රදේශය තුළ පවතින දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සම්බන්ධයෙන් 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය පදනම් කරගනිමින් අතුරු ව්‍යවස්ථාවක් සම්මතකර ආදායම් වැඩිකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | ගැසට්පත්‍රය පදනම් කරගෙන ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළයුතු වේ. | මේ සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සම්මත කරගෙන බල ප්‍රදේශය තුල මේ පිළිබද සමීක්ෂණයක් සිදු කොට ආදායම් අයකර ගැනීමට මෙම වර්ෂය ඇතුලත කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1597/08 හා 2009 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද ගාස්තු අනුව අය කිරීම් නොකිරීම හේතුවෙන්, අනුමත කරන ලද | නියමිත ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | අනුමැතිය අනුව ස්ථාපිත කර ඇති දුරකථන කුළුණු සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා අලාභයක් සිදුවී ඇත්නම් එම ප්‍රමාණය ඉඩම් හිමියන්ගෙන් අය කර ගැනීමට |

| | | |
|---|---|---|
| කුළුණු 22 ක් සඳහා රු.110,000 ක පමණ ආදායම් අහිමි වීමක් සිදුව තිබුණි. | | ඉදිරියේදී කටයුතු කරමි. |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 18 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 16 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද එයින් අතුරු ව්‍යවස්ථා 2 ක් ඉටුකරන මට්ටමේ නොමැති බව නිරීක්ෂණය විය. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම හෝ වැළඳ ගැනීම කළයුතු වේ. | ප්‍රාදේශිය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 18 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දිනට කාරණා 16 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ඇති අතර, සතිපොල ගාස්තු අය කර ගැනීම සහ රථ වාහන නවතා තබා ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා සකස්කර කඩිනමින් පනවා ගැනීමට කටයුතු කරමි. |

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 15 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළයුතු වේ. | පනවා ඇති අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව ඇති කර්තව්‍යයන් වෙනුවෙන් 2019 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී කටයුතු කර ඇත. |

(ඇ) <u>කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඇස්තමේන්තුගත පිරිවැය රු.1,803,465 ක් වූ කැරගල ආයුර්වේද ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු 2016 දෙසැම්බර් 26 දින ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.1,192,922 ක් වැයකර ඇස්තමේන්තුවෙන් සියයට හැට හයක් පමණක් නිමකර තිබුණි. | අපේක්ෂිත සැලැස්මට හා කාලයට අනුව ඉදිකිරීම් නිම කළයුතු වේ. | සැපයුම් නිලධාරින් හා තාක්ෂණ නිලධාරින්ගේ ස්ථාන මාරුවීම් නිසා සහ තාක්ෂණ නිලධාරින්ගේ පුරප්පාඩු හේතුවෙන් කඩින් කඩ ප්‍රමාදයන් සිදුවී ඇත. සම්පූර්ණ වැඩ අවසන් නොවුවත්, ගොඩනැගිල්ලෙන් 3/4 ක වැඩ අවසන් කර ඇත. |

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් ගෝලීය දර්ශක තුළින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 වර්ෂය වෙනුවෙන් සකස්කර නොතිබුණි. | සැලසුම් සකස් කිරීමට කටයුතු කළයුතු වේ. | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරිමට දැනුවත් වීමක් නොවූ බැවින්, 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරිමට සැලසුම් සකස්කර ඇත. |

3.2 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | තනතුරු 25 ක පුරප්පාඩු වසර 15 ක සිට පැවතුණි. | සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වේ. | තාක්ෂණ නිලධාරී තනතුරු 01 ක් පුරප්පාඩුව පවතින අතර ඒ සඳහා දැනට පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් තාක්ෂණ නිලධාරී (සැලසුම්) - පුහුණු කිරීමේ ශ්‍රේණියේ නිලධාරිනියක් අනුයුක්ත කර ඇත.අනුමැතිය ලැබී ඇති තනතුරු 06 ක් සඳහා බඳවා ගැනීම් කටයුතු සිදු කරමින් පවතී. |
| (ii) | 2014 දෙසැම්බර් 19 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ සෞඛ්‍ය කම්කරු 07 ක්, ක්ෂේත්‍ර කම්කරු 06 ක්, මුරකරු 04 ක් හා පෙර පාසල් ගුරු 01 ක් ලෙස 18 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී තිබුණද උක්ත චක්‍රලේඛය 05 ප්‍රකාරව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තාකර අනුමත කාර්යය මණ්ඩලයට ඇතුලත් කරගෙන නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | 2014 දෙසැම්බර් 19 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම ආයතනයේ සේවක මහත්ම මහත්මීන් 18 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී ඇති අතර එම චක්‍රලේඛයේ 5 ඡේදය ප්‍රකාරව මෙම තනතුරු අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර ගැනීම සඳහා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත 2014 දෙසැම්බර් 18 හා 2018 ජනවාරි 28 දිනැති ලිපි මගින් අදාළ තොරතුරු යවා ඇත. |

3.2.1 <u>වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් පොදු ඉඩම් 96 කින් ඉඩම් 71 ක වැට මායිම් ඉදිකර අයිතිය හා | සභාව සතු වත්කම් වල අයිතිය හා | ප්‍රාදේශීය සභාවට අයත් පොදු ඉඩම් වල වැටමායිම් ඉදිකර අයිතිය හා |

| | | |
|---|---|---|
| ආරක්ෂාව තහවුරු කරගැනීමට කටයුතු කර නොතිබූ අතර එම ඉඩම්වල පවතින වටිනා ගස් හඳුනාගෙන ලේඛන ගත කිරීමට කටයුතුකර නොතිබුණි. | ආරක්ෂාව තහවුරු කර ගැනීමට කටයුතු කළයුතු වේ. | ආරක්ෂාව තහවුරු කිරීමටත් එම ඉඩම්වල පවතින වටිනා ගස් හඳුනාගෙන ඉන්වෙන්ට්‍රි ගත කිරීමටත් කටයුතු කරමි. |

3.2.2 **<u>වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් කඩ කාමර 21 ක් ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව කුලියට දී තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට කඩ කාමර 19 ක හිඟ කඩකුලිය රු.236,921 ක් වී තිබුණි. | සභාවට අයත් දේපල කුලී පදනමට ලබා දීමේදී ගිවිසුම් අත්සන් කළයුතු වේ. | ගිවිසුම් අත්සන් නොකළ කඩ කාමරවල ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරමි. 2018 දෙසැම්බර් 31 දිනට හිඟ මුදලින් කොටසක් අයවී ඇති අතර, මුදල් නොගෙවූ කඩ කාමර හිමියන් සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කරමි. |

3.2.3 **<u>පවරා නොගත් වත්කම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 වර්ෂයේ සහ 2015 වර්ෂයේ ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග කරන ලද රු.11,178,226 ක් වටිනා වාහන 02 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිත්‍යාග ලෙස ලැබූ වාහන පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | 2012 වර්ෂයේ සහ 2015 වර්ෂයේ ප්‍රාදේශිය සභාවට පරිත්‍යාග කරන ලද රු.11,178,226 ක් වටිනා වාහන 02 ක් සඳහා ලියකියවිලි සකස්කර කඩිනමින් පවරා ගැනීමට කටයුතු කරමි. |

3.2.4 **<u>නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් පාලන අමාත්‍යාංශය මගින් සභාවේ ඉල්ලීමකින් තොරව ලබාදී තිබූ ගැල්වනයිස් බට 422 ක් පැරණි ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ලේ ගොඩගසා තිබුණි. | ඌන උපයෝජිත වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. | පනත ප්‍රකාරව සභාවට පැවරී ඇති බලතල අනුව 2018 වර්ෂය සඳහා ගාස්තු පනවා කොඩි කණුවක් රු.20 ක මුදලකට කුලියට දී සභාවට ආදායමක් උපයා ගනිමි. |

3.2.5 **වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ප්ලාස්ටික් පුටු 48 ක ඌනතාවයක් පැවතුණි. | ඌනතාවයට වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පුටු 48 ක ඌනතාවයක් පැවති අතර ඉතිරිය දෙවරක් සටහන් වීම හේතුවෙන් හටගත් ඌනතාවයකි. මෙම ඌනතාවය පිළිබඳ අලාභය තක්සේරු කර අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමි. |

3.3 **ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයට වීජී පහන් මිලදී ගැනීම සඳහා තෝරාගත් සැපයුම්කරු සමග රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 8.9.1(ආ) අනුව ගිවිසුමකට නොබැඳී වීජී පහන් 3300 ක් රු.418 බැගින් මිලදීගෙන තිබුණි. 2018 සැප්තැම්බර් මාසයෙන් පසුව රු.418 මිලට පහන් සැපයීම සැපයුම්කරු ප්‍රතික්ෂේප කර තිබුණ බැවින් රු.488 ක මිලට 23 W වීජී පහන් 2464 ක් මිලදී ගැනීමට සිදුවීම නිසා රු.172,480 ක අතිරේක වැය බරක් සභාවට දැරීමට සිදුවී තිබුණි. | වගකිව යුතු නිලධාරීන්ගෙන් සිදු වූ අලාභය අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | 2019 වර්ෂයේ සිට වීජී පහන් , ටයර් ටියුබ් සහ අනෙකුත් උපකරණ මිලදී ගැනීම සඳහා තෝරාගත් සැපයුම් කරුවන් සමග රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය -2006 හි 8.9.1(අ) අනුව ගිවිසුම්ගත වීමට කටයුතු කරමි. |